**ප්‍රශ්න පත්‍ර 39**

**www.swithanage.com**
**Youtube : S Withanage**

01. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් තම ආයතනයේ ශිෂ්‍ය තොරතුරු පවත්වාගෙන යාමට පද්ධතියක් භාවිතා කිරීමට සැලසුම් කරයි. මෙම අවශ්‍යතාවය සඳහා අවශ්‍ය තොරතුරු පද්ධතිය ඉතා ඉක්මනින් අවශ්‍ය බැවින් වාණිජ පෙරනිමි පද්ධතියක් (Commercial off the shelf - COST) භාවිතා කිරීමට ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කරන ලදී. අධ්‍යක්ෂක මණ්ඩලය ගන්නා ලද මෙම තීරණය සම්බන්ධව පහත ක්ෂේත්‍ර ඔස්සේ ඔබගේ අදහස් දක්වන්න.

1. වාණිජ පෙර නිමි පැකේජයක් භාවිතා කිරීමට සැලසුම් කර ඇති බැවින් අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීමට අවශ්‍ය නොවේ.

   ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේ ද ? පැහැදිලි කරන්න.

2. පෙර නිමි පැකේජයක් භාවිතයේ දී ඇතිවිය හැකි ගැටලු මොනවා ද ?
3. පෙර නිමි පැකෙජයක් භාවිතයේ දී එහි ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමට යොදා ගත හැකි පරීක්ෂා ක්‍රමවේදය කුමක් ද ?
4. මෙවැනි තොරතුරු පද්ධතියක් ලබාගැනීම, නව තොරතුරු පද්ධතියක් සංවර්ධනය කර ගැනීමට වඩා අඩු පිරිවැයකින් සිදු කර ගැනීමට හැකියාව පැවතිය හැකි බව අධ්‍යක්ෂක මණ්ඩලයේ අදහස විය. මෙම අදහසට ඔබ එකග වන්නේ ද ?
5. නඩත්තුව සහ පුහුණුව යන ගැටලු ඇති විය හැකි බැවින් පිරිවැය සහ වැඩි කාලයක් ගත වුවද නව තොරතුරු පද්ධතියක් නිර්මාණය කර ගැනීම සුදුසු බව ආයතනයේ ගණකාධිකාරිවරයාගේ අදහස විය. මෙම අදහසට ඔබ එකග වන්නේ ද ? පැහැදිලි කරන්න.

02. මොටර් රථ නිපදවන සමාගමකට තම ආයතනයේ නිපදවන මෝටර් රථයක පිරිවැය ගණනය කර ගැනීම පහසු කරගැනීමට තොරතුරු පද්ධතියක් උපයෝගී කරගැනීමට අදහස් කරයි. නිපදවන රථයේ දත්ත සහ ඇතැම් තොරතුරු පද්ධතියට ලබාදුන් විට පද්ධතිය විසින් අදාල රථයේ නිෂ්පාදන වියදම, පද්ධතිය තුල පවත්නා දත්ත පාදකයක ඇති දත්ත උපයෝගී කරගෙන ගණනය කර එහි වාර්තාවයක් සැපයිය යුතුයි.

මෙම පද්ධතිය සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ පද්ධති සංවර්ධන කණ්ඩායමට පද්ධතිය හා බැඳි කාර්යය බද්ධ අවශ්‍යතා නිවැරදිව හඳුනා ගැනීමට, අදාල ආයතනයේ ඉංජිනේරුවරුන් විසින් ලබාදුන් තොරතුරු මත සංකීර්ණ විය.

මෙවැනි අවස්ථාවක දී පද්ධති සංවර්ධන කණ්ඩායමට අනුගමනය කළ හැකි සංවර්ධන ආකෘතිය වන්නේ කුමක් ද ?

03. අලුතින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති හෝටල් ව්‍යාපෘතියක් සඳහා තොරතුරු පද්ධති කිහිපයක් භාවිතා කිරීමට අදාල හෝටල් සමූහයේ කළමනාකාරිත්වය තීරණය කර ඇත. එහිදී ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුව මෙහෙයුම් අවශ්‍යතා කළමනාකරණය කර ගැනීමට තොරතුරු පද්ධතියක්, කළමනාකරණ තීරණ ගැනීමට තොරතුරු පද්ධතියක් සහ ව්‍යුහගත නොවන තීරණ ගැනීමට තොරතුරු පද්ධතියක් මෙන්ම සමස්ථ

කාර්යයන් කළමනාකරණය කර ගැනීමට ව්‍යවසාය සම්පත් පද්ධතියක් යොදා ගැනීමට සැලසුම් කර ඇත. මෙම පද්ධති ආයතනයක භාවිතා වන ස්ථාන සුදුසු රූප සටහනක් ආශ්‍රයෙන් නිරූපණය කරන්න.

04. කාණ්ඩ සැකසුම් තොරතුරු පද්ධතියක් භාවිතා වන ආයතනයක්, ඒ සඳහා යොදා ගනු ලබන පරිගණක ගත තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක වන පරිගණකයේ ධාරිතාවය සහ වේගය යන තත්ත්වයන් වඩාත් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගත යුතු බව දෘඩාංග ඉංජිනේරුවරයෙක් සඳහන් කරන ලදී. මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේ ද ? පැහැදිලි කරන්න.

## බහුවරණ ප්‍රශ්න

01. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පියවර ගණන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න

i. 5 ii. 6 iii. 7 iv. 8

02. පද්ධති සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. පද්ධතියක් යනු නිශ්චිත අරමුණක් ඉටු කරගැනීම සඳහා අන්තර් සම්බන්ධතාවයකින් යුක්තව ක්‍රියාත්මක වන ඒකකයකි.
ii. පද්ධතියක් යනු පාසලකි.
iii. පද්ධතියක් යනු මෘදුකාංගයක එක් ඒකකයකි.
iv. යම් අරමුනක් ඉටු කරගැනීමට ක්‍රියාත්මක වන ඒකකයක කොටසක් පද්ධතියක් ලෙස හැඳින්වේ.

03. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ නිවැරදි පියවර තෝරන්න.

i. ගැටළුව හඳුනා ගැනීම සහ ශක්‍යතා අධ්‍යයනය, විශ්ලේෂණය, සැලසුම් කිරීම, සංවර්ධනය, පරීක්ෂාව, ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම.
ii. පවත්වාගෙන යාම, ස්ථාපනය, ශක්‍යතා අධ්‍යයනය, විශ්ලේෂණය, සැලසුම් කිරිම, ගැටළුව හඳුනා ගැනීම.
iii. ගැටළුව හඳුනා ගැනීම සහ විශ්ලේෂණය, සැලසුම් කිරීම, සංවර්ධනය කිරිම, පරීක්ෂාව, ස්ථාපනය, පවත්වාගෙන යාම.
iv. ගැටළුව හඳුනා ගැනීම, ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් කිරිම, සංවර්ධනය කිරිම, පරීක්ෂාව, ස්ථාපනය කිරිම, පවත්වාගෙන යාම.

S.Withanage

04. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ ගැටළුව හඳුනා ගැනීමට අදාල පියවරේ සිදු කරනු ලබන කාර්යයන් වලට අයත් වන ප්‍රකාශය තෝරන්න.

i. මූලික විමර්ශනය, ආර්ථික ශක්‍යතාව, මෙහෙයුම් ශක්‍යතාව, තාක්ෂණික ශක්‍යතාව
ii. කාර්යය බද්ධ සහ කාර්යය බද්ධ නොවන අවශ්‍යතා හඳුනා ගැනීම.
iii. සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ඍජු නිරීක්ෂණය, පවත්නා පොත් පරීක්ෂා කිරිම.
iv. ඉහත කිසිවක් නොවේ.

05. පද්ධති විශ්ලේෂණ අවස්ථාවේ දී කාර්යය බද්ධ අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිතා කළ හැකි ක්‍රමවේදයන් දක්වා ඇති ප්‍රකාශය කුමක් ද ?

i. ප්‍රශ්ණාවලි සැකසීම, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, පවත්නා පොත් පරීක්ෂා කිරීම, නිරීක්ෂණය
ii. නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ප්‍රශ්ණාවලි සැකසීම.
iii. ප්‍රශ්ණාවලි සැකසීම, නිරීක්ෂණය, සේවකයින් සමඟ සාකච්ඡා කිරිම
iv. ඉහත පළමු සහ දෙවන කාර්යයන් දෙකම.

S.Withanage

06. ප්‍රශ්නාවලි භාවිතා කරමින් කාර්යය බද්ධ අවශ්‍යතා හඳුනා ගැනීම වඩාත් සුදුසු වන්නේ පහත දක්වා ඇති කුමන වර්ගයේ පද්ධතියක් සංවර්ධනය කිරීමේ දී ද ?

i. පද්ධතිය සඳහා පුද්ගලයින් කිහිප දෙනෙකු පමණක් සම්බන්ධ වන අවස්ථාවක.

ii. පද්ධතියට සම්බන්ධ වන බාහිර පුද්ගලයන් ප්‍රමාණය වැඩි වන අවස්ථාවක දී ඔවුන් පද්ධතියට සම්බන්ධ ව කරන කාර්යයන් හඳුනා ගැනීමට.

iii. නිර්මාණය කරන පද්ධතියේ කාර්යය බද්ධ අවශ්‍යතා පැහැදිලිව දන්නා අවස්ථාවක.

iv. පද්ධතිය ඉතා විශාල අවස්ථාවක.

07. පද්ධතියක කාර්යය බද්ධ නොවන අවශ්‍යතා සඳහා වඩාත් ගැලපෙන ප්‍රකාශනය තෝරන්න.

i. වැටුප් සකසන තොරතුරු පද්ධතියක් සකසන අවස්ථාවක සේවක පැමිණීම ඇතුළත් කිරීම කාර්යය බද්ධ අවශ්‍යතාවයක් නොවේ.

ii. තොග පාලන මෘදුකාංග පද්ධතියක් සකස් කරන අවස්ථාවක කළමනාකරුට ඉතිරි තොග ප්‍රමාණයන් බලාගැනීමට හැකියාව ලැබීම.

iii. භාවිතා කරන පද්ධතියේ දත්ත සුරක්ෂිත කිරීමේ ක්‍රමවේදයක් යොදා පවතින අවස්ථාවක.

iv. භාවිතා කරන පද්ධතියේ දත්ත වෙනත් අයට කියවා ගත නොහැකි ලෙස රහස් කේතනයන් වෙත මාරු වීමට සකසා තිබීම.

08. ශක්‍යතා අධ්‍යයනයක් තුළින් බලාපොරොත්තු වනුයේ කුමක් ද ?

i. යෝජිත තොරතුරු පද්ධතිය ආයතනයට ප්‍රතිඵල දායකද, ලාභදායි ද, අවශ්‍යද, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාවන් පවතීද යන්න සොයා බැලීම.

ii. යෝජිත පද්ධතිය භාවිතා කරන කාර්යය මණ්ඩලය හඳුනා ගැනීම.

iii. යෝජිත තොරතුරු පද්ධතිය ආයතනයේ කාර්යය මණ්ඩලයට ගැලපේද යන්න සොයා බැලීම.

iv. ඉහත සියල්ලම.

09. මූලික විමර්ශනය සහ ශක්‍යතා අධ්‍යයනය අවසන් වූ පසු ඒ පිළිබඳව සකස් කරන වාර්තාව ඊළගට යොමු කරනු ලබන්නේ,

S.Withanage

i. අධ්‍යක්ෂක මණ්ඩලයට හෝ ආයතනයේ ප්‍රධානියාට

ii. සුදුසුකම් ලත් බාහිර ගණකාධිකාරි අයතනයකට

iii. පද්ධති විශ්ලේශකට iv. මෘදුකාංග සංවර්ධන නිලධාරීයාට

10. පද්ධති සැලසුම් අවස්ථාවේ සිදු නොකරන කාර්යය තෝරන්න.

i. ගැලීම් සටහන් සැකසීම ii. ව්‍යාජ කේත සැකසීම

iii. අතුරු මුහුණත් සැකසීම. iv. සකස් කරන ලද ඒකක පරීක්ෂා කිරිම.

11. ගැලීම් සටහන් පිළිබඳව දක්වා ඇති නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

i. ගැලීම් සටහන යොදා ගනු ලබන්නේ මෘදුකාංගය සංවර්ධනය කිරීමට මඟ පෙන්වීමක් ලෙසයි.

ii. ගැලීම් සටහන් නිර්මාණය සඳහා සම්මත සංකේත භාවිතා කරනු ලැබේ.

iii. ගැලීම් සටහනක අන්තර්ගත පුනර්කරණය, වරණය සහ අනුක්‍රමණය කොටස් අන්තර්ගතය.

iv. ගැලීම් සටහනක් නිර්මාණය කරනු ලබන්නේ මෘදුකාංග සංවර්ධනය කරන නිලධාරියා විසිනි.

S.Withanage

12. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයෙදි මෘදුකාංගය නිර්මාණය වීම ආරම්භ වන්නේ පහත දක්වා ඇති අවස්ථාවන්ගෙන් කුමන අවස්ථාවේ දී ද ?

i. විශ්ලේෂණ අවස්ථාවේ දී
ii. සංවර්ධනය කරන අවස්ථාවේ දි
iii. පරීක්ෂා කරන අවස්ථාවේ දී
iv. කාල මංජුස පරීක්ෂාවේදි

13. පද්ධති පරීක්ෂා කිරීම්වලට අදාල පහත දක්වා ඇති ප්‍රකාශයන්ගෙන් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

i. කාල මංජුස පරීක්ෂාව, ශ්වේත මංජුස පරීක්ෂාව, ඒකක පරීක්ෂාව, පද්ධති පරීක්ෂාව සිදු කරනු ලබන්නේ මෘදුකාංගය සංවර්ධනය කරන ආයතනය තුළ දීය.

ii. ශ්වේත මංජුස පරීක්ෂාව සඳහා සාමාන්‍ය දැනුම සහිත උසස් පෙල සමත් සිසුවෙකු ප්‍රමාණවත් ය.

iii. කාල මංජුස පරීක්ෂාව මගින් ආදාන සහ ප්‍රතිදාන කෙරෙහි සැලකිල්ල යොමු කරනු ලැබේ.

iv. ශ්වේත මංජුස පරීක්ෂාව සඳහා මෘදුකාංග සංවර්ධනය පිළිබඳ දැනුමක් සහිත අයෙකු යොදා ගත යුතුය.

14. ප්‍රතිග්‍රහණ පරීක්ෂාව පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කාල මංජුස පරීක්ෂාව හා සමානව ප්‍රතිග්‍රහන පරීක්ෂාව මෘදුකාංගය සංවර්ධනය කරන ආයතනයේ දී සිදු කරනු ලැබේ.

ii. කාල මංජුස පරීක්ෂාවේදී යොදා ගත් කාලයම ප්‍රතිග්‍රහණ පරීක්ෂාව සඳහා යොදා ගත යුතුය.

iii.ප්‍රතිග්‍රහණ පරීක්ෂාව සිදු කරනු ලබන්නේ තොරතුරු පද්ධතිය භාවිතා කරන ආයතනයේ කාර්යය මණ්ඩලය හා සමඟ එක්ව ය.

iv. ප්‍රතිග්‍රහණ පරීක්ෂාව සඳහා පද්ධතිය භාවිතා කරන කාර්යය මණ්ඩලය අවශ්‍ය නොවේ.

15. පද්ධතියක දෝෂවලට අදාල පහත දක්වා ඇති ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. පද්ධතියක් පවත්නා සියළු දෝෂ, ඒවා පරීක්ෂා කරන අවස්ථාවේ දී හඳුනා ගැනීමට පුළුවන.

ii. පද්ධතියක පවත්නා ඇතැම් දෝෂ පද්ධති පරීක්ෂා කරන අවස්ථාවේ දී පවා හසු නොවීමට හැකියාව ඇත.

iii. කාල මංජුස පරීක්ෂාව මගින් මෘදුකාංග දෝෂ සියල්ල සකසා ගත හැක.

iv. පද්ධති දෝෂ ඉතා පහසුවෙන් හඳුනා ගැනීමට පුළුවන.

S.Withanage

16. පද්ධති ස්ථාපනය කිරීමට අදාල පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි නොවන ප්‍රකාශනය තෝරන්න.

i. පද්ධතියක් ස්ථාපනය කිරිමේ දී සමාන්තර ස්ථාපනය, ඍජු ස්ථාපනය භාවිතා කළ හැකිය.

ii. සමාන්තර ස්ථාපනය බොහෝ විට දත්ත විශාල වශයෙන් භාවිතා වන එමෙන්ම බාහිර පාර්ශ්වයන් ඍජුවම සම්බන්ධ වන පද්ධතිවලට වඩා සුදුසුය.

iii. සරළ කාර්යයක් සඳහා සකස් කරනු ලබන පද්ධතියක් සඳහා ඍජු ස්ථාපනය ගැලපේ.

iv. වැටුප් සැකසීමට යොදා ගන්නා පද්ධතියක් සකස් කළ පසු ඒ සඳහා ඍජු ස්ථාපනය භාවිතා කිරීම ගැටලුවක් නොවේ.

17. නියමු ස්ථාපනයට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ශාඛා කාර්යාල හෝ දෙපාර්තමේන්තු රාශියක් ඇති අවස්ථාවක දී එක් දෙපාර්තමේන්තුවක් හෝ ශාඛාවක් වෙත පද්ධතිය ස්ථාපිත කර එය සාර්ථක නම් අනෙක් ඒවාට ස්ථාපිත කිරීම නියමු ස්ථාපනයට අදාල වේ.

S.Withanage

ii. සියළු ශාඛා සහ කාර්යාල වෙත තොරතුරු පද්ධතියක ස්ථාපිත කිරීම නියමු ස්ථාපනය වේ.

iii. නියමු ස්ථාපනය සාර්ථක වන්නේ සකස් කරන ලද පද්ධතිය එක් ශාඛාවක් උදෙසා පමණක් සකස් කරන විටය.

iv. නියමු ස්ථාපනය සෑම පද්ධතියකටම එක සමානව භාවිතා කළ හැකිය.

18. පද්ධති ස්ථාපන අවස්ථාවේ දී සිදුකරනු ලබන කාර්යයන් අයත් නොවන කරුණ තෝරන්න.

i. කාර්යය මණ්ඩලය නව පද්ධතියට පුහුණු කිරීම ii. කාර්යය මණ්ඩලයට පද්ධතිය භාවිතා කරන ආකාරය පිළිබඳ සැකසු උපදෙස් පොත ලබාදීම

iii. නව පරිගණක වෙත සකස් කළ පද්ධතිය ස්ථාපිත කිරීම iv. පද්ධතියේ කාර්යය නොවන අවශ්‍යතා සොයා බැලීම.

19. මෘදුකාංග නිර්මාණය කරන ආයතනයක් පවත්වාගෙන යන සමන් බණ්ඩර වෙත පැමිණි ප්‍රදේශයේ හෝටලයක් පවත්වාගෙන යන ව්‍යාපාරික මහතෙකු තම ආයතනයට විදේශික සංචාරකයන් පැමිණෙන විට ඔවුන්ට විදේශ රටවල සිටම හෝටලයේ තොරතුරු විමසීම, කාමර තොරතුරු විමසීම, ආහාර පිළිබඳ තොරතුරු විමසීම ආදීය සිදු කළ හැකි අයුරින් වෙබ් අඩවියක් සකස් කර දෙන්නැයි ඉල්ලීමක් කරනු ලැබීම. ඒ අනුව සමන් මුලින්ම කළ යුතු කාර්යය පහත පෙන්වා ඇති කරුණු අතරින් නිවැරදිව තෝරන්න.

i. අදාල පුද්ගලයාගේ හෝටලයට ගොස් මූලික විමර්ශනයක් සිදු කර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් අදාල හෝටලයේ අයිතිකරුට ලබාදීමයි.

ii. පසුදා ම හෝටලයට ගොස් එහි කාර්යය මණ්ඩලය මුණ ගැසී මෘදුකාංගය සකස් කරගැනීමේ කටයුතු ආරම්භ කිරීමයි.

iii. මෘදුකාංගය සකස් කිරීමට අදාල මුදල පවසා අත්තිකාරම් මුදලක් ලබාගැනීමයි.

iv. අදාල හෝටලයේ තොරතුරු පෞද්ගලික වෙබ් අඩවියක් සකසා අන්තර්ජාලයට යොමු කිරිමයි.

20. ශිරන්ති මෘදුකාංග සංවර්ධනය කරනු ලබන සමාගමක සේවය කරනු ලැබේ. ඇය විෂුවල් බේසික් / ජාවා පිළිබඳ පාඨමාලාවක් හදාරා එහිදී උගත් පරිගණක භාෂාවක දැනුම භාවිතා කරමින් අදාල සමාගමේ සේවය කරනු ලැබේ. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ කුමන අවස්ථාවකට ඇය සම්බන්ධව කටයුතු කරන්නේ ද යන්න තෝරන්න.

i. පද්ධති විමර්ශන අවස්ථාවේ ii. පද්ධති සැලසුම් අවස්ථාවේ දී

iii. ස්ථාපනය කිරීම සහ කාර්යය මණ්ඩල පුහුණු iv. පද්ධති විශ්ලේෂණ අවස්ථාව.

## A/L ICT ගොඩයන්න විධිමත් වැඩ පිළිවෙලක්

- සිද්ධාන්ත 12 සහ 13 පොත් දෙක සමඟ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩපොත ලබාගෙන සිද්ධාන්ත සමඟ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකරමින් දැනුම වර්ධනය කරගන්න. (සිද්ධාන්ත පොත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ඇත)
- ඉන්පසු ප්‍රශ්න 1500 කට අධික (බහුවරණ / රචනා) ප්‍රශ්න පොත ලබාගෙන පාඩමෙන් පාඩමට ප්‍රශ්න සහ පිළිතුරු විශ්ලේෂණය කියවන්න.
- කෙටි සටහන් පොත මඟින් කෙටි සටහන් කියවා ගන්න.
- www.swithanage වෙබ් අඩවියට ඔන්ලයින් ප්‍රශ්න පත්‍ර භාවිතයෙන් බහුවරණ ප්‍රශ්න සහ පිළිතුරු පුහුණු වන්න.
- වෙබ් අඩවියේ ඇති ප්‍රශ්න පත්‍ර ගබඩාවෙන් ව්‍යුහගත සහ රචනා ප්‍රශ්න පත්‍ර බාගත කරගෙන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියන්න.
- ඔබගේ පිළිතුරු S Withanage Youtube චැනලයට යොමු වී ප්‍රශ්න පත්‍ර සාකච්ඡාවට අදාල වීඩියෝ මගින් නිවැරදි ද යන්න තහවුරු කරගන්න.
- S Withanage Youtube චැනලය Subscribe කර පාඩම් පැහැදිලි කිරීම් වලට සම්බන්ධ වෙන්න.
- ඔන්ලයින් (Online) පංතියට සහභාගි වන්න. (විමසීම් 071 747111 / 071 5610274)




සිංහල සහ ඉංග්‍රිසි මාධ්‍යයෙන් සමන්විත මෙම පොත් 12 ඔබගේ නිවසට ම ගෙන්වා ගැනීමට 070 2075999 / 071 5610274 / 071 747 1181 යන අංකවලට කතා කරන්න.